# අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

IWWRMP

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

**(ණය අංකය : IDA- 6621-LK)**

### වික්ටෝරියා වේල්ලේ ක්ෂාර- සමස්ත ප්‍රතික්‍රියාව අධ්‍යයනය කිරීම, වේල්ලේ ආරක්ෂාවට එහි බලපෑම තක්සේරු කිරීම සහ හඳුනාගත් ගැටලු සඳහා පිළියම් යෝජනා කිරීම සඳහා ස්ථායිතා විශ්ලේෂණයක් සිදු කිරීම, සඳහා උපදේශන සේවාව

**කොන්ත්‍රාත් අංකය : LK - MoMDE - 433807 - CS- QCBS**

01. ශ්‍රී ලංකා රජය වෙත ලෝක බැංකුව වෙතින් ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ලැබීම්වලින් කොටසක් උපදේශන සේවා සඳහා යෙදවීමට අදහස් කෙරේ.

02. වික්ටෝරියා වේල්ලේ ව්‍යුහාත්මක අඛණ්ඩතාවයේ මට්ටම තක්සේරු කිරීම, ක්ෂාර– සමස්ත ප්‍රතික්‍රියාවේ (AAR) බලපෑම සහ වෙනත් විභව ව්‍යුහාත්මක විරූපන හේතු අධ්‍යනය කිරීම. සහ වේල්ලේ ආරක්ෂාව සඳහා AAR හෝ වෙනත් විභව හේතුන්ගේ බලපෑම අවම කිරීමට සුදුසු පිළියම් යෝජනා කිරීම සහ වේල්ලේ දිගුකාලීන ආරක්ෂාව සහ ස්ථායිතාව වැඩිදියුණු කිරීම මෙම උපදේශන සේවාවේ ප්‍රධාන අරමුණු වේ. 2026 අප්‍රේල් මාසයෙන් ආරම්භ වීමට නියමිත අපේක්ෂිත පැවරුමෙහි කාලය මාස 10 කි. මෙම සේවා පිළිබඳ වැඩිදුර විස්තර යොමු අනුදේශයන්හි (TOR) දක්වා ඇත.

03. පැවරුම පිළිබඳ වැඩිදුර විස්තර ඇතුළත් යොමු අනුදේශ (TOR) https://www.iwwrmp.lk/web/procurement/section/procurement-notice හි දක්වා ඇත.

04. දැනට පවතින සැලසුම් ලේඛන, ඉදිකළ ආකාරය පෙන්වන සැලසුම් චිත්‍ර, අධීක්ෂණ දත්ත සහ විකිටෝරියා වේල්ල අදාළ පෙර අධ්‍යයන සමාලෝචනය කිරීම, ක්ෂාර සමස්ත ප්‍රතික්‍රියාව (AAR) හෝ ඊට අදාළ සංසිද්ධි හඳුනාගැනීම සඳහා කොන්ක්‍රීට් පරීක්ෂාව, සාම්පල ලබාගැනීම සහ රසායනාගාර විශ්ලේෂණ පැවැත්වීම, නියමිත බර පැටවීම් සහ ජලාශ තත්ත්වයන් යටතේ පසු විශ්ලේෂණය සහ ස්ථායිතා තක්සේරුව සිදු කිරීම සඳහා වේල්ලේ සහ අත්තිවාරමේ ත්‍රිමාණ සීමිත මූලද්‍රව්‍ය විශ්ලේෂණ (FEA) ආකෘතියක් සංවර්ධනය කිරීම, සවිස්තරාත්මක ස්ථායිතා සහ ආරක්ෂක විශ්ලේෂණ වාර්තාවක් (බරපතල තත්ත්වයන් හඳුනාගැනීම, සමාතරණ ප්‍රතිඵල සහ නිරීක්ෂණ දත්ත සමග වලංගුකරණය ඇතුළුව) සකස් කිරීම, පිරිවැය ඇස්තමේන්තු සහිතව පිළියම් සහ/ හෝ අතිරේක අධීක්ෂණ සහ පරීක්ෂණ අවශතා යෝජනා කිරීම සහ ප්‍රමුඛතාවයදීම, ක්‍රියාත්මක කිරීමේ සහ අර්ථකථන අත්පොතක් සහිත අනුකරණ ආකෘතියක් භාරදීම මෙන්ම සේවායෝජකයාගේ තාක්ෂණික කාර්යය මණ්ඩලය සඳහා පුහුණුවක් පැවැත්වීම උපදේශන සේවයට ඇතුළත් වේ.

05 IWWRMP විසින් අදාළ හෝ සමාන පළපුරුද්දක් ඇති සුදුසුකම්ලත් උපදේශකවරුන්ගෙන් (ආයතනවලින්) අභිලාෂ ප්‍රකාශ කරන මෙන් ඉල්ලා සිටියි.)

06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන උපදේශකවරුන් පහත සඳහන් කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්ණායක අනුව සේවාවන් සිදු කිරීමට අවශ්‍ය සුදුසුකම් සහ අදාළ පළපුරුද්ද තමන් සතු බවට තොරතුරු (සමාගම් පැතිකඩ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සුදුසුකම්, අත්පත්‍රිකා ආදිය) ඉදිරිපත් කළ යුතුය.

    අ. උපදේශකවරයා සතුව TOR හි විස්තර කර ඇති සියලුම අංශයන්හි විස්තීරණ කළමනාකරණ සහ තාක්ෂණික දැනුම, ප්‍රමාණවත් සම්පත් සහ නවීන තාක්ෂණයට ප්‍රවේශය තිබිය යුතු අතර, විශේෂයෙන් පසුගිය වසර දහය (10) ඇතුළත විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති යටතේ සිදු කරන ලද AAR විමර්ශන අධ්‍යයන ඇතුළු වේලි සම්බන්ධ පසු විශ්ලේෂණයක් පිළිබඳ සනාථ කළ හැකි සමාන පළපුරුද්දක් තිබිය යුතුය.

    ආ. උපදේශකවරයා විසින් සමාන උපදේශන පැවරුම්වලට අදාළව ඔප්පු කළ පළපුරුද්දක් සහ සුදුසු විශේෂඥ දැනුම සහිත ප්‍රමාණවත් තරම් ස්ථිර කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යායුතු අතර, කොන්ක්‍රීට් පරීක්ෂණ, භූ තාක්ෂණික විමර්ෂණ සහ සංඛ්‍යාත්මක ආකෘති ඇතුලු බහුවිධ අධ්‍යයනයන් කළමනාකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ශක්තිමත් තාක්ෂණික හා කළමනාකරණ හැකියාවක් ප්‍රදර්ශණය කළ යුතුය. උපදේශකවරයා විසින් වර්තමාන පැවරුම සඳහා සුදුසුකම්ලත් විශේෂඥයින්ද යෝජනා කළ යුතු අතර, ඔවුන්ගේ සුදුසුකම් අදාළ පළපුරුද්ද සහ ආයතනය සමග සිටි වසර ගණන පිළිබඳ විස්තර සැපයිය යුතු අතර, යෝජිත කාර්යය මණ්ඩලය අතර, සුදුසු කුසලතා තිබීම තහවුරු කළ යුතුය. (මෙම අදියරේදී CV ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

    ඇ. උපදේශකවරයා විසින් පසුගිය වසර පහ (5) සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් ශක්තිමත් මූල්‍ය ස්ථායිතාව සහ ධාරිතාව පෙන්නුම් කළ යුතුය. (උපදේශකවරයාගේ පවතින කාරක ප්‍රාග්ධනය ධනාත්මක විය යුතුය.)

    ඇ. වෙනත් සම්පත් සහ නව තාක්ෂණය ආදිය සහිත බව

07. උපදේශකවරුන්ට ඔවුන්ගේ සුදුසුකම් ඉහළ නංවා ගැනීම සඳහා වෙනත් ආයතන සමග ඒකාබද්ධ විය හැකි නමුත්, එම ඒකාබද්ධ වීම හවුල් ව්‍යාපෘතියක්ද සහ/හෝ උප– උපදේශනයක්ද යන්න පැහැදිලිව දැක්විය යුතුය. හවුල් ව්‍යාපාරයකදී තෝරාගනු ලැබුවහොත්, හවුල් ව්‍යාපාර සියලුම හවුල්කරුවන් සම්පූර්ණ කොන්ත්‍රාත්තුව සඳහා හවුල්ව හා තනි තනිව වගකිව යුතුය. කිසියම් ආයතනයකට/ සංවිධානයකට තනි උපදේශකයෙකු ලෙස හවුල් ව්‍යාපාර පාර්ශවකරුවකුලෙස හෝ උප– උපදේශකයකු ලෙස තනි එක් යෝජනාවකට පමණක් සහභාගී වීමට අවසර ඇත.

08. මේ පිළිබඳව උනන්දුවක් දක්වන උපදේශන ආයතනයන් හි අවධානය, ලෝක බැංකුවේ බැඳියාවන් අතර පිළිගැටුම පිළිබඳ ප්‍රතිපත්තිය දැක්වෙන 2016 ජූලි දිනැති, 2017 නොවැම්බර් සහ 2018 අගෝස්තු සංශෝධිත IPF ණය ලබන්නන් සඳහා වන ලෝක බැංකුවේ ප්‍රසම්පාදන රෙගුලාසි හි III වන කොටසේ 3.14, 3.16 සහ 3.17 යන ඡේද වෙත යොමු කෙරේ.

09. ලෝක බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව, එනම් 2016 ජූලි දිනැති, 2017 නොවැම්බර් සහ 2018 අගෝස්තු සංශෝධිත IPF ණය ලබන්නන් සඳහා වන ප්‍රසම්පාදන රෙගුලාසි හි දක්වා ඇති ක්‍රමවේදය අනුව, ගුණාත්මකභාවය සහ පිරිවැය මත පදනම් වූ තෝරාගැනීමේ පටිපාටිය අනුගමනය කරමින් උපදේශකවරයකු තෝරාගනු ලැබේ.

10. අභිලාෂී උපදේශකයින්ට වැඩිදුර තොරතුරු, වැඩ කරන දිනයන්හිදී කාර්යාලීය වේලාව තුළ 09.00 පැය සිට 15.00 පැය දක්වා පමණක් පහත ලිපිනයේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත්) වෙතින් ලබාගත හැක. (දුරකථන : +94 11 2691163, ඊමේල් : iwwrmp@sltnet.lk)

11. අභිලාෂ ප්‍රකාශ කිරීම්, 2025 දෙසැම්බර් 30 වන දින 14.00 පැයට (දේශීය වේලාව) පෙර ලැබෙන පරිදි අනු පිටපතක් සහිතව ලිඛිත ආකෘතියෙන් සහ මෘදු පිටපතකින් (අතේ ගෙනයා හැකි උපාංග (USB), DVD, CD ආදිය) පහත ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත,**
**කොළඹ 07, ශ්‍රී ලංකාව.**
**දුරකථන : 94 - 112691163**

**2025 නොවැම්බර් 26 වන දින**